RG/ MBD/ 1/ 2012

Your No.

Telephone Nos. 2889488, 2889489

Fax No. 2889491

E-mail rgd@sltnet.lk, rg@rgd.gov.lk

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகம் திணைக்களம்
REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

Web site www.rgd.gov.lk

P. O. Box No.

234/A3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

234/A3,
Denzil Kobbakaduwa Mawatha,
Battaramulla.


Date: 2012.12. 26

චක්‍රලේඛ අංක 7/ 2012

සියළුම ප්‍රාදේශීය ලේකම්/ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාරවරුන්
ඉඩම් රෙජිස්ට්‍රාර සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාරවරුන්

**උප්පැන්න විවාහ හා මරණ සහතික පිටපත් නිකුත් කිරීමේ ගාස්තු,**
**ප්‍රකාශ පත්‍ර සඳහා වන ගාස්තු සහ පරිවර්තන පිටපත් සඳහා වන ගාස්තු සංශෝධනය කිරීම.**

2013 වර්ෂය සඳහා අයවැය යෝජනා යටතේ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අංක FP/06/60/01/01 හා 2012.12.20 දින දරණ ලිපිය පරිදි 2013.01.01 දින සිට පහත සඳහන් ගාස්තු සංශෝධනය කර ඇත.

| | කාරණය | සංශෝධිත ගාස්තුව |
|---|---|---|
| 1 | සහතික කළ පිටපතක් සඳහා ඉල්ලුම් කිරීමේදී ලේඛන සෝදිසි කිරීමක් අවශ්‍ය නොවන අවස්ථාවක සහතික කළ පිටපතක් හෝ උද්ධෘතයක් හෝ ලියාපදිංචි නොකිරීමේ සහතිකයක් හෝ නිකුත් කිරීම සඳහා | රු. 100.00 |
| 2 | සහතික කළ පිටපතක් සඳහා ඉල්ලුම් කිරීමේදී අවු. 2 ක් නොඉක්මවන කාල පරිච්ඡේදයක ලේඛන සෝදිසි කිරීමක් අවශ්‍ය වන සහතික කළ පිටපතක් හෝ උද්ධෘතයක් හෝ ලියාපදිංචි නොකිරීමේ සහතිකයක් හෝ නිකුත් කිරීම සඳහා | රු. 200.00 |
| 3 | උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 52(1), 27, 27අ වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශ පත්‍රවලට එක් ප්‍රකාශ පත්‍රයක් සඳහා | රු. 50.00 |
| 4 | ඉපදී මාස 12 ක් ඇතුලත හෝ මාස 12 ක් ඉක්මවූ කල්ගත උපතක් ලියාපදිංචි කිරීම සඳහා වන 24 වගන්තිය යටතේ වන ප්‍රකාශ පත්‍රයක් සඳහා | රු. 50.00 |
| 5 | මියගොස් මාස 12 ක් ඇතුලත හෝ මාස 12 ක් ඉක්මවූ කල්ගත මරණයක් ලියාපදිංචි කිරීම සඳහා වන 36 වගන්තිය යටතේ වන ප්‍රකාශ පත්‍රයක් සඳහා | රු. 50.00 |
| 6 | විවාහ උප්පැන්න හා මරණ සහතික පරිවර්තනය කිරීමට එක් පිටපතක් සඳහා | රු. 500.00 |

02. මහජනයාගේ දැන ගැනීම සඳහා මෙම සංශෝධිත ගාස්තු පිළිබඳ දැන්වීමක් ඔබේ කාර්යාලයේ ප්‍රදර්ශනය කිරීමට කරුණාකර පියවර ගන්න.

03. ඔබේ බල ප්‍රදේශයේ විවාහ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාරවරුන්ටද ගාස්තු සංශෝධනය පිළිබඳ දැනුවත් කරන්නේ නම් මැනවි.

රෙජිස්ට්‍රාර් ජනරාල්

ඩී. එම්. ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත්:

1. නියෝජ්‍ය ලේකම්, මහාභාණ්ඩාගාරය - ඔබගේ අංක FP/06/60/01/01 හා 2012.12.20 දිනැති ලිපිය අනුව කරුණාකර දැන ගැනීම සඳහා
2. ලේකම්, රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යංශය - කරුණාකර දැන ගැනීම සඳහා
3. විගණකාධිපති - කරුණාකර දැන ගැනීම සඳහා
4. ප්‍රධාන ගණකාධිකාරී - අවශ්‍ය කටයුතු සඳහා
5. ප්‍රධාන කාර්යාලයේ සහ මධ්‍යම ලේඛනාගාරයේ සියළුම මාණ්ඩලික නිලධාරීන් - කරුණාකර දැන ගැනීම සඳහා
6. සියළුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - කරුණාකර දැන ගැනීම සඳහා
7. සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් - කරුණාකර දැන ගැනීම සඳහා